ස.සේ.කො.චක්‍රලේඛ අංක 04/2020

මගේ අංකය : ස.සෙ.කො./6/චක්‍ර/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2020.12.28

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු,

## මූලික විමර්ශනයක් පැවැත්වීම වෙනුවෙන් දීමනාවක් ගෙවීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.11.16 දින ලබා ගත් කොමිෂන් සභා නියෝගය අනුව, 2000.09.18 දිනැති අංක 11/2000 චක්‍රලේඛය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධන 2021.01.01 දින සිට බලාත්මක වන බවත් වැඩිදුරටත් දන්වමි.

02. ඒ අනුව සමුපකාර සමිති වල මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා පත් කරනු ලබන නිලධාරීන්ට පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| ඉටු කරන කාර්යය | දීමනාව ( රු.) |
|---|---|
| මූලික විමර්ශන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම | 1,500.00 |
| චෝදනා පත්‍ර කෙටුම්පත් පිළියෙල කර ඉදිරිපත් කිරීම | 1,000.00 |

03.ඉහත 02 ඡේදයෙහි දීමනා ලබා ගැනීමට නම් මූලික විමර්ශනය සඳහා නියම කර ඇති කාල සීමාව තුළ එකී පරීක්ෂණය අවසන් කර තිබිය යුතු අතර, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කරන්නේ නම්, මූලික විමර්ශන වාර්තාව සමඟ චෝදනා පත්‍ර කෙටුම්පතද සකස් කර භාර දීම නියමිත කාල සීමාව තුළ සිදුකර තිබිය යුතුය. මූලික විමර්ශනයක් හැකිතාක් ඉක්මනින් අවසන් කළ යුතු අතර ප්‍රායෝගික ගැටලු මතුවන අවස්ථා වලදී උපරිම වශයෙන් සති 04ක් ඇතුළත නිම කළ යුතුය.

04. මූලික විමර්ශන නිලධාරියා හෝ කමිටුව නිසි කාල කළමනාකරණයකින් යුතුව මූලික විමර්ශනයට දී ඇති කාලය තුළ එය කඩිනමින් නිම කළ යුතුය. කිසියම් හේතුවක් නිසා මූලික විමර්ශනයක්, ලබා දුන් කාලයට වඩා ප්‍රමාද වූයේ නම් එවැනි මූලික විමර්ශන සඳහා පහත පරිදි දීමනා ලබා දිය හැකි වේ.

| නියමිත දිනට වඩා ප්‍රමාද වූ කාලය | 02 ඡේදයේ සඳහන් දීමනාවෙන් ගෙවිය යුතු ප්‍රතිශතය |
|---|---|
| මාසයක් හෝ ඊට අඩු | 75% |
| මාසයකට වැඩි මාස 02ක් හෝ ඊට අඩු | 60% |
| මාස 02 කට වැඩි මාස 03 ක් හෝ ඊට අඩු | 50% |

05. නියමිත දිනට මාස 03 කට වඩා කල් පසු වී බාර දෙන මූලික විමර්ශන වාර්තා සඳහා දීමනා ගෙවනු නොලැබේ.

06. මූලික විමර්ශන නිලධාරියෙකු වෙත හෝ කමිටුවක් වෙත 02 ඡේදයට අදාළ ගෙවීම් කිරීමට පෙර, ඉදිරිපත් කර ඇති මූලික විමර්ශන වාර්තාවේ ගුණාත්මකභාවය පිළිබඳව ද අදාල බලධරයන් විසින් අවධානය යොමු කළ යුතු බව අධාරණය කරමි.

07. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.